| | |
|---|---|
| | **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| | දෙවන වාර පරීක්ෂණය - 2025 |
| 10 **ශ්‍රේණිය** | **කෘෂි හා ආහාර තාක්ෂණය - II** |

නම/ විභාග අංකයඃ ........................................ කාලය පැය 2 යි

- **පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01) ගම්පහ දිස්ත්‍රික්කයේ පිහිටි පාසලක 10 ශ්‍රේණියේ කෘෂිකර්මය හදරන සිසුන් ගොවිපළක් නිරීක්ෂණය කිරීමට ක්ෂේත්‍ර චාරිකාවකට සහභාගී විය. මෙම ගොවිපළෙහි තවාන් පැළ නිපදවූ අතර එළවළු හා පළතුරු බෝග වගා කරන ලදි.

i.
  a) කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ප්‍රධාන අංශ දෙක නම් කරන්න.
  b) අතීතයේ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සශ්‍රීකත්වයට හේතු වූ කරුණු දෙකක් ලියන්න.

ii.
  a) මෙම දිස්ත්‍රික්කය අයත් දේශගුණික කලාපය නම් කරන්න.
  b) එම කලාපයෙහි බහුලව දක්නට ලැබෙන පස් කාණ්ඩය කුමක්ද?

iii.
  a) ශ්‍රී ලංකාවෙහි ප්‍රධාන වගා කන්න කීයද?
  b) ඒවා නම් කරන්න.

iv.
  a) නිරිතදිග මෝසම් වර්ෂාව පදනම් කරගෙන වගා කරන කන්නය කුමක්ද?
  b) නිරිතදිග මෝසම් වර්ෂාව ලැබෙන කාලසීමාව ලියන්න.

v.
  a) පාත්තිවල තවාන් දමා පැළ නිපදවා ගන්නා එළවළු බෝග වර්ග දෙකක් සඳහන් කරන්න.
  b) බීජ කෙළින්ම ක්ෂේත්‍රයෙහි සිටවන එලවළු බෝග වර්ග දෙකක් සඳහන් කරන්න.

vi. ගෙවත්තක වගා කිරීමට සුදුසු
  a) පොළ්සියේ කුලයේ බෝග වර්ග දෙකක් නම් කරන්න.
  b) කුකර්බිටේසියේ කුලයේ බෝග වර්ග දෙකක් නම් කරන්න.

vii.
  a) බෝග වගාවේ දී තවාන් පාත්ති ජීවානුහරණය සඳහා යොදා ගන්නා ක්‍රම දෙකක් සඳහන් කරන්න.
  b) ගෙවත්තක කම්බි වැටකට යැවීම සඳහා සිටුවිය හැකි වැල් බෝග දෙකක් නම් කරන්න.

viii.
  a) තවානට වසුන් ලෙස භාවිතා කළ හැකි ද්‍රව්‍ය දෙකක් නම් කරන්න.
  b) වසුන් යෙදීමේ වාසි දෙකක් ලියන්න.

ix.
  a) තවාන් මිශ්‍රණය සකසා ගැනීම සඳහා භාවිතා කරන ද්‍රව්‍ය දෙක මොනවාද?
  b) එම ද්‍රව්‍ය මිශ්‍ර කරගත යුතු අනුපාතය සඳහන් කරන්න.

x.
  a) ශ්‍රී ලංකාවේ බහුලව වගා කරනු ලබන වර්ෂයේ ඕනෑම කාලයක අස්වනු ලබා දෙන පළතුරු බෝග වර්ග දෙකක් සඳහන් කරන්න.
  b) ගෙවත්තක බණ්ඩක්කා වගා කිරීමේ දී නිර්දේශිත වලක ප්‍රමාණය සඳහන් කරන්න.

02) මිනිස් ක්‍රියාකාරකම් අඩු, සෝදු පාළුව නොමැති පෙදෙස්වල පූර්ණ පස් පැතිකඩ දැකිය හැකිය. පැතිකඩෙහි විවිධ වර්ණයෙන් හා ඝනකමින් යුක්ත වූ ස්ථර දැකිය හැකිය.

i. පාංශු පැතිකඩක රූප සටහන් ඇඳ කොටස් නම් කරන්න.

ii.

a) වැඩිපුරම කාබනික ද්‍රව්‍ය අඩංගු වනුයේ කුමන ස්ථානයේ ද?

b) පසෙහි කාබනික ද්‍රව්‍ය තිබීම මගින් බෝග වගාවට ඇතිවන හිතකර තත්ව දෙකක් ලියන්න.

iii. බඳුන්ගත වගාව සඳහා එම ස්ථරවල පස් යොදා ගැනීමට හේතු දෙකක් ලියන්න.

03) එක්තරා ගොවිපළක කව්පි, කුරක්කන්, තක්කාලි, වට්ටක්කා, කොහිල, මිරිස්, මෑ, බඩඉරිඟු, පතෝල, මුං, වැටකොළු හා වම්බටු ආදිය වවා තිබිණි. මෙම කරුණු උපයෝගී කරගෙන පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i.

a) තක්කාලි හා මිරිස් අයත් කුලය කුමක්ද?

b) කව්පි අයත් කුලයේ ශාකවල විශේෂ වැදගත්කම් දෙකක් ලියන්න.

ii. ඉහත බෝග වලින්

a) වාර්ෂිකව එළවළු බෝග දෙකක් ලියන්න.

b) වියළි කලාපයේ බහුලව වගා කරන බෝග දෙකක් ලියන්න.

c) ජලය රැඳෙන ප්‍රදේශයකට වඩාත් සුදුසු බෝගයක් නම් කරන්න.

iii.

a) බෝග වර්ගීකරණයෙන් කෘෂිකර්මාන්තයට ඇති ප්‍රයෝජන දෙකක් ලියන්න.

b) ආවරණ බෝග සඳහා උදාහරණ දෙකක් ලියන්න.

04) වර්ෂාපතනය ප්‍රමාණවත් නොවන විට, ජල සම්පාදනය මගින් ශාකවලට අමතරව ජලය ලබා දිය යුතුය.

i. පහත සඳහන් එක් එක් ආකාරය යටතට ගැනෙන ජල සම්පාදන ක්‍රම දෙකක් බැගින් සඳහන් කරන්න.

a) පෘෂ්ඨීය ජල සම්පාදනය

b) උප පෘෂ්ඨීය ජල සම්පාදනය

ii. විසිරි ජල සම්පාදනයේ වාසි දෙකක් ලියන්න.

iii. සුදුසු ජල සම්පාදන ක්‍රමයක් තෝරා ගැනිමේ දී සැලකිය යුතු කරුණු 4ක් ලියන්න.

05) බිම් සැකසීමේ අරමුණ වන්නේ බෝග පැළ සාර්ථක ලෙස ස්ථාපිත කිරීම සහ වර්ධනය වීම සඳහා අවශ්‍ය පාංශු තත්ත්වයන් සැපයීමයි.

i.

a) මූලික බිම් සැකසීමේ ප්‍රධාන පියවර කීයද?

b) එම පියවර නම් කරන්න.

ii. බිම් සැකසීමේ අරමුණු හතරක් දක්වන්න.

iii. දී ඇති වගුව වරහන් තුළ සඳහන් කර ඇති වචන වලින් සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

| | ප්‍රාථමික බිම් සැකසීමේ උපකරණ | ද්විතීයික බිම් සැකසීමේ උපකරණ | අතුරුයත් ගෑමේ උපකරණ |
|---|---|---|---|
| අතින් ක්‍රියාකරවන | A ………………….<br>B …………………. | C …………………. | D …………………. |
| සත්ත්ව බලයෙන් ක්‍රියා කරවන | E …………………. | F …………………. | |
| යන්ත්‍ර බලයෙන් ක්‍රියාකරවන | G …………………. | H …………………. | |

(සැහැල්ලු යකඩ නඟුල / හැඩ ලැලි නඟුල / උදැල්ල / අත් පොරව / ජපන් රොටරි වීඩරය / රොටවේටරය / තැටි නඟුල/ දැති පෝරුව / ඇනදත් පෝරුව / තෝනෝ වීඩරය)

06) කෘෂිකාර්මික කටයුතු පහසු කර ගැනීම සඳහා කාලගුණික දත්ත ඉතා ප්‍රයෝජනවත් වේ.

i. කාලගුණය යන්න පැහැදිලි කරන්න.

ii.

a) බෝග වගාවට වැදගත් වන දේශගුණික සාධක 4ක් නම් කරන්න.

b) ඒවා මනිනු ලබන උපකරණ සඳහන් කරන්න.

iii. බෝග වගාවට සුළඟ හිතකර වන ආකාර දෙකක් ලියන්න.

iv. කෙටි දින, දිගු දින හා උදාසීන ශාක සඳහා උදහරණ දෙක බැගින් ලියන්න.

07) ශ්‍රී ලංකාව තුළ ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා විවිධ ක්‍රියාකාරකම් රැසක් ගෙන ඇත.

i. ආහාර සුරක්ෂිතතාව යනු කුමක්ද?

ii. ආහාර සුරක්ෂිතතාව කෙරෙහි බලපාන ප්‍රධාන සාධක තුන නම් කරන්න.

iii. හරිත විප්ලවය සමඟ කෘෂි කර්මාන්තයේ සිදුවූ වෙනස්කම් හතරක් ලියන්න.

iv. බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රම ඇති කිරීමේ අරමුණු තුනක් ලියන්න.